Department of Education,Sabaragamuwa Province/ Weekly School Department of Education,Sabaragamuwa Province/ Weekly School Department

පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව සබරගමුව- සතිපාසල

විෂය:- නාට්‍ය හා රංග කලාව

සතිය - 21

ශ්‍රේණිය :- 11

Prepared by - කලාප අධ්‍යාපන කාර්යාලය, කෑගල්ල

3.3

අර්ථවත්සංවාද භාවිතාකිරීම

පුනරීක්ෂණඅභ්‍යාස

පහත සංවාද ඛණ්ඩ ඇසුරින් ප්‍රශ්න 1සිට 6 දක්වා පිළිතුරුසපයන්න.

A. කුමරාවචනය;

" වසන්ත ශ්‍රීයෙන් අලංකාරවූමඟුල්මඩුවකට බඳුවූ වනයෙහි ස්වභාව නරඹමින් යනවිට ගමන් විඩාව ඉබේම මග හැරේ.

B. ගaaෂා;

" වීස්ස තිහ වුනත් මට කමක් නෑ මම කියලා දෙන්නම් ඔහේගේ නීතිය ගැන. ඔහේ දන්න ඉටි ගෙඩියක් නෑ නීතිය ගැන.

C. සිදගන;

ඇයිද යකුනි තොපි පෙරළි කරන්නේ

කෑ කෝ ගසමින් බෙරි හඩ දෙන්නේ

නිසංසලේ අපි මෙතන සිටින්නේ

එහෙව් අපිට ඇයි තොපි ඉන්ට නොදෙන්නේ

D. සිංහබාහු

නැත පියාණෙනි කිසිදු මන දොළ

සමාවනු මැන දොසක් වීනම්

වෙසෙන සඳ මේ පාලු ලෙන තුල

නෙක් දිසා සිත පියාඹා යයි

E. මව;

මේ කපු මහත්තයට අල්ලන්න ළමයෝ කපු මහත්තයට

කපුවා:

පුංචි නෝනට නිතරෝම මාව අමතක වෙනවා

1.ඉහත A හි සංවාද ඛණ්ඩය භාවිතා වන්නනේ

1 ) හුණුවටයේ නාට්‍ය 2) මගුල් ප්‍රස්ථාව නාට්‍ය

3) මනමේ නාට්‍ය 4) සිංහබාහු නාට්‍ය

2.නාට්‍ය ධර්මී ශෛලිය භාවිත කරමින් සංවාද භාවිත කරඇතිනාට්‍ය යුගලය වන්නේ

(1) A හා D

(2) B හා C

(3) A හා B

(4) B හා D

3.ඉහත E අදාල නාට්‍ය නිර්මාපකයාවන්නේ

(1) එදිරිවීරසරත්චන්ද්‍රමහතා

(2) බන්දුලජයවර්ධනමහතා

(3) සෝමලතාසුබසිංහමහත්මිය

(4) ආර්යවංශරණවීරමහතා

4.ඉහත B ට අදාලරචකයාවන්නේ

(1) බර්ටෝල් බ්‍රෙස්ට්

(2) හෙන්රික් ඉබ්සන්

(3) සැමුවෙල් බෙකට්

(4) ඇන්ටන් චෙකොෆ්

5).ඉහත සංවාද ඛණ්ඩය ඇතුළත් නාට්‍යය නිර්මාණය වන්නේ

(1) බෙර හඬ

(2) සිංහබාහු

(3) නරිබෑනා

(4) එලවගිහින් මෙලොව ආවා

6).ඉහත D හී සඳහන් පද කොටස කවර අභිනයට අයත්ද?

(1) ආහාර්යඅභිනය

(2) වාචිකඅභිනය

(3) ආංගිකඅභිනය

(4) සාත්විකඅභිනය

7 ). පහත සඳහන් ප්‍රශ්න සඳහා පිළිතුරු සපයන්න

(1) නාට්‍යක නළුවන් විසින් ගායනා කරනු ලබන ගීත කොටස් කවර අභිනයට අයත් වේද?

(2) නාට්‍යක සංවාද භාවිතා කිරීමේදී සැලකිලිමත් විය යුතු කරුණු 5ක් දක්වන්න

(3) නාට්‍යයක් සාර්ථක වීම සඳහා සංවාද වල ඇති ප්‍රභලත්වය පිළිබඳ උදාහරණ සහිතව පැහැදිලි කරන්න.